# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1687/23 - 2011 ජනවාරි 05 වැනි බදාදා - 2011.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9අ වැනි වගන්තියේ (*අ*) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම, 1987 මැයි මස 15 වැනි දිනැති අංක 453/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයකින් සංස්ථාපනය කරන ලද එරාවුර් ප්‍රාදේශීය සභාව, එරාවුර් නගර සභාව සංස්ථාපනය කිරීම සඳහා 2011 අප්‍රේල් මස පළමුවැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හරිමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2010 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ දී ය.

01 - 386/1

1A - G 12040 — 830 (2011/01)

**නගර සභා ආඥාපනත**

නියමය

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 2, 3, 5 සහ 9 වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම, මෙම නියමයෙන් —

(1) මෙහි උපලේඛනයේ නිරූපිත ප්‍රදේශය එම පනතේ කාර්යයන් සඳහා නගරයක් විය යුතු යයි ප්‍රකාශ කරමි ;

(2) එම උපලේඛනයේ දක්වා ඇති සීමා එම නගරයේ පරිපාලන සීමා ලෙස නියම කරමි ;

(3) මෙම නියමයේ (1) වැනි ඡේදය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නගරය සඳහා නගර සභාවක් සංස්ථාපනය කර පහත සඳහන් නාමය සහ අභිධානය පවරමි :—

"එරාවූර් නගර සභාව";

(4) එරාවූර් නගර සභාව සභාපතිවරයකු උප සභාපතිවරයකු සහ තවත් සභිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතු යයි නියම කරමි ;

(5) එරාවූර් නගර සභාවේ ධූර කාලය ආරම්භ විය යුතු දිනය, 2011 අප්‍රේල් මස පළමුවැනි දිනය වශයෙන් නියම කරමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2010 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ දී ය.

01 - 386/01

**උපලේඛනය**

***II වැනි කොටස***

මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර් නගර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි,

(190) එරාවූර් - 1, (190ඒ) එරාවූර් - 1ඒ, (191) එරාවූර් - 2, (191ඒ) එරාවූර් - 2ඒ, (191බී) එරාවූර් - 2බී, (192) එරාවූර් - 3, (192ඒ) එරාවූර් - 6, (192 බී) එරාවූර් - 3ඒ, (192 සී) එරාවූර් - 6ඒ, (194) එරාවූර් - 4, (194ඒ) එරාවූර් - 5, (194බී) එල්ලෙයිනගර්, (190බී) එරාවූර් - 1බී, (191සී) එරාවූර් - 2සී, (192ඩී) එරාවූර් - 6ඩී යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සමන්විත එරාවූර් නගරය;

උතුරට :

උතුරු මායිම් පාර ත්‍රිකුණාමලය - මඩකලපුව පාර හමුවන ආරම්භක ලක්ෂ්‍යයේ සිට උතුරු මායිම් පාර ඔස්සේ ඊසාන දෙසට නැගෙනහිර මායිම් පාර හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට එකී පාර ඔස්සේ ගිනිකොණ දිසාවට කුඩියිරුප්පු පටුමගෙහි උතුරු අන්තය හමුවන ලක්ෂ්‍යය දක්වා ඇඳින ලද රේඛාවකින් ද;

නැගෙනහිරට :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට දකුණු දෙසට කුඩියිරුප්පු පටුමග ඔස්සේ ත්‍රිකුණාමලය - මඩකලපුව මාර්ගය හරහා කුඩියිරුප්පු පටු මගෙහි ප්‍රතිවිරුද්ධ පටුමග හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට එම පටුමග සහ කුඹුරු ඉඩම් ඔස්සේ කලපුව දක්වා ඇඳින ලද රේඛාවකින් ද;

දකුණට :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කලපුවේ පහළ ජල මට්ටම ඔස්සේ බටහිර දිසාවට නයිනවේලී කුඹුරු පටුමග හමුවන ලක්ෂ්‍යය දක්වා ඇඳින ලද රේඛාවකින් ද;

බස්නාහිරට :

අවසන් වරට සඳහන් කරන ලද ලක්‍ෂ්‍යයේ සිට උතුරු දෙසට කඹුරු පටුමග සහ වඩ්ඩෙයිවිදානේගේ පටුමග ඔස්සේ තමරවික්කුලම් දක්වා ද, එතැන් සිට තමරවික්කුලම්හි නැගෙනහිර හා උතුරු මායිම් ඔස්සේ උතුරු දිසාවට කරත්ත පාර දක්වා ද, එතැන් සිට කරන්ත පාර ඔස්සේ ආරම්භක ලක්‍ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවකින් ද මායිම් වේ.

01 - 386/2

---

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

### නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9අ වන වගන්තියේ (ආ) ජේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම, 2010 ඔක්තෝබර් මස 12 වැනි දිනැති අංක 1675/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයෙන් සංශෝධිත, 1987 මැයි මස 12 දිනැති අංක 453/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සම්මන්තුර ප්‍රාදේශීය සභාව සංස්ථාපනයට අදාළ නියමය, මෙම නියමයෙන් —

(1) එහි (4) වැනි ජේදයේ සඳහන් "පස් දෙනෙකුගෙන් "යන පද ඉවත් කර ඒ වෙනුවට "හත් දෙනෙකුගෙන් "යන පද ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි;

(2) යථොක්ත සංශෝධනය 2011 අප්‍රේල් මස පළමුවැනි දින සිට බලාත්මක විය යුතු යයි නියම කරමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ,
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ දී ය.

01 - 386/3

---

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

### නියමය

(2 වැනි අධිකාරිය වන) අර්ථනිරූපන ආඥාපනතේ 18 වැනි වගන්තිය සමග කියවිය යුතු, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 6 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම, මෙම නියමයෙන් 2009 ජුනි මස 12 දිනැති අංක 1605/48 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව සංස්ථාපනයට අදාළ නියමය, එහි (5) වැනි ජේදයේ සඳහන් "2010 අප්‍රේල් මස පහළොස්වන දිනය" යන පද ඉවත් කර ඒ වෙනුවට "2011 අප්‍රේල් මස පළමු වැනි දිනය" යන පද ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ,
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ දී ය.

01 - 386/04

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.